ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


මගේ අංකය / எனது இல. / My No. :

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2022-09-08

පැමිණිලි පාර්ශවය : කේ.ඒ.විජේසේකර මහතා,
අංක : 12, රූපසිරි මාවත,
මිරිහාන, නුගේගොඩ.

වගඋත්තර පාර්ශවය : 01. නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව,
තැ.පෙ. අංක 06,
ශ්‍රී ජයවර්ධනපුර.

02. නාගරික ඉංජිනේරු,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව,
තැ.පෙ. අංක 06,
ශ්‍රී ජයවර්ධනපුර.

<u>පැමිණිලි අංකය : **HRC/225/16/ I – 23**</u>

**පැමිණිල්ල :**

නුගේගොඩ, මිරිහාන, රූපසිරි මාවතේ ඇල මාර්ගයේ සිදුවන අනවසර ඉදි කිරීම් හා එකී අනවසර ඉදි කිරීම් ඉවත් නොකිරීම හේතුවෙන් ප්‍රදේශවාසින් පීඩාවට පත්වීම, ජන ජීවිතය අඩාල වීම හා නිවාස ජලයෙන් යටවීමේ අවධානමක් ඇති වීම සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් කොමිෂන් සභාව වෙත 2016.01.12 වන දින පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් කරුණු දක්වා ඇත.

ඉහත කාරණයට අදාළව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් එම්.ජී.ජේ.කුමාර රාමනායක යන අයෙකුට විරුද්ධව අංක : 12763 යටතේ 2012.11.06 දින පවරා ඇති නඩුවේදී ද ගංගොඩවිල




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office : 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் : 011-2505451
ෆැක්ස් / தொலைநகல் : 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் : sechrcsl@gmail.com

මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඉහත ඇල මාර්ගය තුළ සිදුකොට ඇති අනවසර ඉදි කිරීම් කඩා ඉවත් කිරීමට නියෝග ලබාදී ඇති බවටත්,

නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ (බලාත්මක) විසින් 2011.11.01 දිනැති ලිපිය මඟින් ඉහත අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් මහ නගර සහා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කොට එකී අනවසර ඉදි කිරීම් කඩා ඉවත් කිරීමට කටයුතු කළ යුතු බවට පළමු වන වගඋත්තරකාර නාගරික කොමසාරිස් වෙත දැනුම්දී ඇති බවත් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර සිටි.

තවද, මිරිහාන රූපසිරි මාවතේ අභය සුභ සාධක සංගමයේ සභාපති විසින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය වෙත යොමු කරන ලද පැමිණිල්ල අනුව ප්‍රශ්ණගත රූපසිරි මාවතේ ඇල මාර්ගයේ සිදු කොට ඇති අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්)තුමා විසින්, පළවන වගඋත්තර පාර්ශවය වෙත 2008.12.18 දිනැති ලිපිය මඟින් එකී ඉදි කිරීම් කඩා බිඳ ඉවත් කිරීමට අදාළ නිර්දේශ සියල්ල ලබාදී ඇති බවයි.

එසේම, බස්නාහිර පළාත් පාලන කොමසාරිස් 2009.10.29 දිනැතිව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරාධිපතිනිය වෙත ලිපියක් යොමු කරමින්, අදාළ මාර්ගයේ ඇති අනවසර ඉදි කිරීම් ඉවත් කිරීම සඳහා දී ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා එකී අනවසර ඉදිකිරීම්කරුවන් සම්බන්ධයෙන් නිසි අධිකරණයක් ඉදිරියේ නඩු පවරා ඒ බව දැනුම්දිය යුතු බවටත්, ඒ සම්බන්ධයෙන් දැරීමට සිදුවන වියදම් අය කර ගන්නා ආකාරය පිළිබඳවත් ලිඛිතව පුළුල් උපදෙස් ලබාදී ඇති බවත්ය.

තවද, සහකාර පළාත් පාලන කොමසාරිස් (කොළඹ දිස්ත්‍රික්කය) විසින් 2008.11.04 දිනැතිව ලේකම්, බස්නාහිර පළාත් සභාව වෙත ලබාදී ඇති නිර්දේශයන්ට අනුව සියළු අනවසර ඉදි කිරීම් ඉවත් කොට ඇල මාර්ගය නඩත්තු කල යුතු බවටත්, ඇල මාර්ගය මැනුම් කර ඇල රක්ෂිතය වෙන් කිරීමද, අනවසර ඉදි කිරීම් ඉවත් කළ යුතු බවට ද නිර්දේශ ඉදිරිපත් කොට ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

පැමිණිලි පාර්ශවය විසින් පැමිණිල්ලට අදාළව ඉහත සියළු ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කර ඇති අතර, වගඋත්තර පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සිය ලිඛිත හා වාචික දේශන මඟින් දන්වා ඇත්තේ අධිකරණ නියෝගයන් ප්‍රකාරව තමන් ක්‍රියා කොට ඇති බවත්, ඒ අනුව මේවනවිට ප්‍රශ්ණගත අනවසර ඉදි කිරීම් ඉවත් කොට යථා තත්ත්වයට පත් කොට ඇති බවත්ය.

නමුත් පැමිණිලිකරු දිගින් දිගටම සිය ලිඛිත හා වාචික කරුණු දැක්වීම් ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ, වගඋත්තර පාර්ශවය මුල් අවස්ථාවේදී අධිකරණ නියෝග ප්‍රකාරව අදාළ අනවසර ඉදි කිරීම් කඩා ඉවත් කළ නමුත්, නැවත එම ස්ථාන වලම අදාළ පාර්ශවකරුවන් විසින් මුල් අනවසර ඉදි කිරීම ම සිදු කොට ඇති බවත්ය.

ඒ බව වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත 2017.09.07 දිනැතිව යොමු කොට ඇති වාර්තාව සමඟ අමුණා ඇති නාගරික ඉංජිනේරු ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් 2017.08.31 දිනැතිව ජයවර්ධනපුර කෝට්ටේ සහ නගර සභාවේ නීති නිලධාරි වෙත යොමු කොට ඇති වාර්තාව පරීක්ෂා කොට බැලීමේදී ද තහවුරු වී ඇත. එකී වාර්තාවට අනුව ඇතැම් අනවසර ඉදි කිරීම් අධිකරණ නියෝගය පරිදි මේ දක්වාම ඉවත් කොට නොමැති බවත්, නමුත් ඇතැම් අනවසර ඉදි කිරීම් මුල් අවස්ථාවේදී ඉවත් කොට ඇතත් නැවත මේවනවිට එම ස්ථාන වලම නැවත එකී අනවසර ඉදි කිරීම් ඉදි කොට ඇති බවත් තහවුරු වී ඇත.

**නිරීක්ෂණ :**

- වගඋත්තර පාර්ශවය විසින් දිගින් දිගටම අධිකරණ නියෝග හා ඒ ඒ වගකිව යුතු ඉහළ නිලධාරින් හා ආයතන මඟින් ලබාදී ඇති නීත්‍යානුකූල උපදෙස් පිළි නොපදින බව කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වී ඇත.

- මෙම තත්වය ප්‍රබල පරිපාලන අකාර්යක්ෂමතාවයක් හා නීතිය සර්ව සාධාරණව ක්‍රියාත්මක නොකිරීමක් ලෙස තවදුරටත් නිරීක්ෂණය වේ.

- එසේම මෙකී නොකර හැරීම් තුළින් පැමිණිලිකරු ඇතුළු ප්‍රදේශවාසි ජනතාව දැඩි මහජන පීඩාවකට පත්ව ඇති බව නිරීක්ෂණය වී ඇත.

**නිගමනය :**

ඒ අනුව ඉහත සියළු කරුණු සලකා බැලීමෙන් පසු වගඋත්තර පාර්ශවයේ ක්‍රියාවන් හේතුවෙන් පැමිණිලි පාර්ශවය ඇතුළු සියළු ප්‍රදේශවාසීන්ගේ මානව හිමිකම් උල්ලංඝනය වෙමින් පවතින බවට නිගමනය කරමි.

නිර්දේශය : -

1. ඒ අනුව වගඋත්තර පාර්ශවය විසින් පැමිණිල්ල මගින් ප්‍රශ්ණගත කොට ඇති ප්‍රදේශ තුළ පවත්නා සියළු නීත්‍යානුකුල නොවන අනවසර ඉදි කිරීම් තමන්ට පැවරී ඇති බලතල ප්‍රකාරව කඩා ඉවත් කිරීමට ක්‍රියා කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. එසේම සියළු වගකිව යුතු නිලධාරින්, ආයතන මෙන්ම අධිකරණ මගින් ලබාදී ඇති නියෝග ප්‍රකාරව ක්‍රියා කළ යුතුය.

3. තවද අනවසර ඉවත් කිරීම් සිදුකිරිමේදි අගතියට පත්වන පාර්ශවයන් සම්බන්ධවද විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව පිලිබඳ සලකා බලා ඒ පිළිබඳ කටයුතු කිරිම කළ යුතුයි.

4. තවද අනවසර ඉවත් කිරීම් සිදුකිරිමේදි අගතියට පත්වන පාර්ශවයන් සම්බන්ධවද විකල්ප ක්‍රියාමාර්ග ගැනිමට ඇති හැකියාව පිළිබඳ සලකාබලා ඒ පිළිබඳ කටයුතු කිරිම කළ යුතුයි.

2022. 10 . 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරලු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ.නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M. ...
Human ... of Sri Lanka